සූරියවැව ප්‍රාදේශීය සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය නොකළ මතය

සූරියවැව ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන වලින් 2024 දෙසැම්බර් 31 දිනට සූරියවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන්, අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය	2017 වර්ෂයේදී වසම් 02 ක් දියුණු කළ ප්‍රදේශ ලෙස හඳුනා ගෙන දේපල 1918 ක් වරිපනම් අයකිරීම සඳහා ප්‍රකාශයට පත්කර තිබුණද, එම දේපල වලින් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නොතිබීමෙන් සභාවේ ආදායම් පුළුල් කරගැනීමේ අවස්ථාව අහිමිවී තිබුණි.	තක්සේරුව ලැබුණු පසු වරිපනම් අයකිරීමට කටයුතු කරන බව.	දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර තිබූ වසම් දෙකෙහි වරිපනම් අයකිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/ 2010/01 දරණ චක්‍රලේඛයේ 05 ඡේදය	සෑම කඩ කාමර ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළ යුතු වුවත්, සභාව සතු කඩ කාමර 05 ක් එපරිදි යාවත්කාලීන කර නොතිබුණි.	තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වාර්තාව ලැබුණු පසු ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව.	චක්‍රලේඛයේ යොමුගත වගන්තිය ප්‍රකාරව සභාව සතු කඩ කාමර ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.මිලියන 4.82 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.මිලියන 16.37 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාවේ ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
වෙනත් බදු	2,078,000	1,870,000	1,935,965	28,070	2,131,000	2,921,420	2,987,555	94,035
කුලී	30,459,400	28,330,000	32,256,056	2,063,830	41,775,500	45,733,014	51,963,710	5,989,886
බලපත්‍ර ගාස්තු	1,493,100	1,893,150	1,999,350	2,000	1,379,000	1,695,600	2,474,175	108,200
වෙනත් ආදායම්	3,634,500	4,616,932	6,704,747	492,950	4,718,500	4,221,076	6,479,466	2,580,765
එකතුව	**37,665,000**	**36,710,082**	**42,896,118**	**2,586,850**	**50,004,000**	**54,571,110**	**63,904,906**	**8,772,886**

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට මුළු හිඟ ආදායම රු.මිලියන 8.77 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.මිලියන 36.71 ක් විය. ඒ අනුව වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.මිලියන 45.48 ක් වුවද, රැස්කරන ලද ආදායම රු.මිලියන 42.90 ක් වූයෙන් ආදායම රැස්කිරීමේ ප්‍රගතිය සියයට 94 ක මට්ටමක විය.	ආදායම් ඇස්තමේන්තුකරණය වඩාත් නිවැරදිව සිදුකිරීමට ඉදිරියේදී කටයුතු කරන බව.	අත්කරගත් ප්‍රගතිය දිගටම පවත්වාගත යුතුය.

2.2.3 කුලී

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 හා 2021 වර්ෂයන්ට අදාළව සමාලෝචිත වර්ෂයේ අවසානයට සභාවේ බදු දේපල 06 කින් රු.මිලියන 1.30 ක මුදලක් අයකර ගෙන නොතිබුණි.	2021 වර්ෂයට අදාළ හිඟ සඳහා කපා හැරීමට අනුමැතිය ලැබුණු පසුව ඉතිරි හිඟය ආරක්ෂිත ඇප මුදලින් හිලව් කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.
(ආ)	සභාවේ කඩ කාමර 48 කින් රු.704,131 ක කඩ කාමර කුලී සහ දඩ මුදල් හිඟව තිබුණු අතර, මෙම හිඟ මුදලින් රු.230,950 ක් 2019 වර්ෂයටත් පෙර සිට පැවත එන ශේෂ විය. සභාව විසින් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තියට අනුකූලව එම මුදල් අයකර ගෙන නොතිබුණි.	මුළු හිඟයෙන් රු.185,838 ක මුදලක් අයකර ගෙන ඇති බව සහ අයකරගත හැකි ඉතිරි මුදල් අයකර ගැනීමටත් අයකරගත නොහැකි හිඟ කපා හැරීමටත් යොමුකර ඇති බව.	පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුය.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.මිලියන 3.19 ක් හා රු.මිලියන 1.30 ක් වූ අතර ලැබිය යුතු මුද්දර ගාස්තු ශේෂය තුළ 2023 වර්ෂයට අදාළව ලැබිය යුතු ශේෂය රු.836,406 ක් විය.	2023 වර්ෂයට අදාළ රු.836,406 ක හිඟ මුදලක් පවතින බව.	හිඟ ආදායම් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂයේදී අනතුරුදායක ගස් සම්බන්ධයෙන් ලැබී තිබූ පැමිණිලි 71 න් පැමිණිලි 44 ක් සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 107(1) වගන්තියට අනුකූලව විසඳුම් ලබාදී නොතිබුණු බව නිරීක්ෂණය විය. එය ලද පැමිණිලි සංඛ්‍යාවෙන් සියයට 62 ක් විය.	මේ වන විට පැමිණිලි 29 ක් විසඳා ඇති බව හා තවත් පැමිණිලි 09 ක් විසඳීමට වෙනත් ආයතන වෙත යොමුකර ඇති බව සහ වැට මායිම් සම්බන්ධ පැමිණිලි 05 ක් විසඳීමට නොහැකි වී ඇති බව.	පනතේ යොමුගත වගන්තිය ප්‍රකාරව විසඳුම් කඩිනමින් ලබාදිය යුතුය.
(ආ)	2024 වර්ෂයේදී මාර්ග අලුත්වැඩියා කිරීම හා සංවර්ධන කිරීම සම්බන්ධයෙන් කොට්ඨාස 06 කින් මහජන පැමිණිලි 135 ක් ලැබී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් පැමිණිලි 92 ක් විභාග කර නොතිබුණි.එය ලද මුළු පැමිණිලි සංඛ්‍යාවෙන් සියයට 68 ක් විය.	ඉල්ලීම් 32 ක් සම්පූර්ණයෙන් ඉටුකර ඇති අතර ඉල්ලීම් 103 ක් සඳහාද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඉදිරියේදී එම ඉල්ලීම් ඉටුකරන බව.	මහජන පැමිණිලි විසඳීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සභාවේ වසම් 21 ට අදාළව වීථි පහන් 3347 ක් පැවතියද වන අලි තර්ජනය හේතුවෙන් නව වීථි ලාම්පු සවිකර දෙන ලෙස 2025 ජනවාරි 28 දිනට ඉල්ලීම් 79 ක් 2023 වර්ෂයේ ජනවාරි මාසයේ සිට ලැබී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඒ සඳහා විසඳුම් ලබාදී නොතිබුණි.	නව වීථි ලාම්පු සවිකිරීම සඳහා අවස්ථා කිහිපයකදී විදුලිබල මණ්ඩලයෙන් ඉල්ලීම් සිදුකළද මෙතෙක් අනුමැතිය ලැබී නොමැති බව සහ ඉල්ලීම් 79 න් 21 කට අදාළව නව වීථි පහන් සවි කර ඇති බව සහ ඉතිරි ස්ථාන පිළිබඳ තවදුරටත් පරීක්ෂා කර කටයුතු කරන බව.	අවශ්‍යතාවය හඳුනාගෙන නව වීථි පහන් සවිකිරීම කඩිනමින් සිදුකළ යුතුය.
(ඈ)	1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 78(1) වගන්තියට අනුකූලව සභා බල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පිළිබඳ කාර්යය ප්‍රාදේශීය සභාව මගින් ඉටුකළ යුතු බව දක්වා තිබුණද, සභා බල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාස පහම ආවරණය වන අයුරින් ඩෙංගු රෝග පාලනය කිරීමේ වැඩසටහන් හා ජලභීතිකා මර්ධන වැඩසටහන් සිදුකර නොතිබුණි.	විවිධ හේතු මත මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාස 05 ම ආවරණය වන පරිදි වැඩසටහන් පැවැත්වීමට නොහැකි වූ බව.	පනතේ විධිවිධාන ප්‍රකාරව රෝග පාලන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

3.2 හඳුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මදුනාගල කසළ ව්‍යාපෘති භූමිය තුළ අවශ්‍ය ජලය ලබා ගැනීම සඳහා නල ළිඳක් ඉදිකිරීම වෙනුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මාතර භූගත ජල අංශය වෙත භූ විද්‍යාත්මක සමීක්ෂණය සිදු කිරීමට 2024 නොවැම්බර් 18 දින රු.46,846 ක්ද, නල ළිඳ ඉදිකිරීම සඳහා 2024 නොවැම්බර් 27 දින රු.553,302 ක ඇස්තමේන්තු වටිනාකමක්ද ලෙස එකතුව රු.600,148 ක් ගෙවා තිබුණි. ඉදිරිපත් කරන ලද භූ විද්‍යාත්මක සමීක්ෂණ වාර්තාවට අනුව ගැඹුර මීටර් 115 දක්වා සැලකිය යුතු ජල පරිමාවක් නොමැති බවත් ඉන් අභ්‍යන්තරයේ ගලක් පිහිටීම නිසා බලාපොරොත්තු වන ජල පරිමාව මෙම නල ළිඳෙන් ලබාගත නොහැකි බවත්, ජල අවශ්‍යතාවය සලකා බලා මීටර් 65 ක් විදුම් ක්‍රමය ඔස්සේ සිදුකිරීමට නිර්දේශ කර තිබුණි. ඊට එකඟව ගෙවීම් කර නල ළිඳ ඉදිකළද එහි ජලය නොමැති වීම නිසා අසාර්ථක වී ඇති බවත්, ඒ හේතුවෙන් දරන ලද රු.281,296 ක් වූ ආපසු නොගෙවන සියයට 50 ක මුදල නිශ්කාර්යවී තිබුණි.	නල ළිඳක් ඉදිකිරීමට සැලසුම් කරන ඕනෑම අවස්ථාවක අසාර්ථක වීමේ සම්භාවිතාවයට මුහුණදීමට සිදුවේ. එබැවින් නල ළිඳ අසාර්ථක ව්‍යාපෘතියක් වීම හේතුවෙන් ඒ සඳහා දරන ලද පිරිවැය නිශ්කාර්යවී තිබුණද එය නොවැලැක්විය හැකි කරුණක් බව.	භූවිද්‍යා සමීක්ෂණ වාර්තාවේ සඳහන් කරුණු අධ්‍යනය කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2021 ජූලි 08 දිනැති හා අංක 2235/54 දරණ ගැසට් පත්‍රයේ 30(1), 30(2) හා (3) වගන්ති ප්‍රකාරව ප්‍රාදේශීය සභාව මගින් 2023 වර්ෂයේ අනුමත කළ ගොඩනැගිලි සැලසුම් 30 ක සංවර්ධන බලපත්‍ර කාලය දීර්ඝ කිරීම හෝ ඉදිකිරීම අවසන් වී ඇත්නම් අනුකූලතා සහතික ලබාදීම සිදුකර නොතිබුණි.	වර්ෂ 01 ඉක්මවූ පසු වලංගු කාලය දීර්ඝ කිරීමටත් වැඩ අවසන් කළ පසු අනුකූලතා සහතික ලබා ගන්නා ලෙසත් සිහි කැඳවීම් කර ඇති බව සහ කාලය දීර්ඝ කිරීම වෙනුවෙන් රු.9,500 ක් අයවී ඇති බව.	යොමුගත ගැසට් පත්‍රයේ වගන්ති ප්‍රකාරව අනුමත කළ ගොඩනැගිලි සැලසුම් වල බලපත්‍ර කාලය දීර්ඝ කිරීම හෝ අනුකූලතා සහතික ලබාදීමට කටයුතු කළ යුතුය.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂයේදී වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ ව්‍යාපාර ඒකක 113 ක් සඳහා නිර්දේශ ලබාදී නොතිබුණු අතර අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කරවා බලපත්‍ර නිකුත් කර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මහජන සෞඛ්‍ය පරීක්ෂක නිර්දේශ ලැබී නොමැති බැවින් වෙළඳ බලපත්‍ර නිකුත් කළ නොහැකි බව සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ නිර්දේශ ලැබීමට යම් ප්‍රමාදයක් පවතින බව.	බලපත්‍ර නිකුත් කර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	2024 වර්ෂයට අදාළව සිදු කරන ලද ව්‍යාපාර සමීක්ෂණයට අනුව පරිසර බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත 04 ක් හඳුනාගෙන තිබුණද, 2025 ජනවාරි 28 දින වන විටත් ඒවාට පරිසර බලපත්‍ර ලබාදීමට කටයුතු කර නොතිබුණි. එසේම 2022 වර්ෂයේදී සිදුකළ ව්‍යාපාර සමීක්ෂණයට අනුව හඳුනාගත් ව්‍යාපාරික ආයතන 25 ක් සඳහා වර්තමානය වන විටත් පරිසර බලපත්‍ර ලබාදීමට කටයුතු නොකිරීම නිසා ව්‍යාපාර මඟින් පරිසරයට වන හානිය පිළිබඳව නියාමනයක් හා සභා අරමුදලට ලබාගත හැකිව තිබූ ආදායමක් අහිමිවී තිබුණි.	2024 වර්ෂයට පරිසර බලපත්‍ර ලබා ගැනීමට දැනුවත් කර ඇති බව සහ ලබා නොගන්නේ නම් නඩු දැමීමට කටයුතු කරන බව සහ 2023 වර්ෂයට අදාළව බලපත්‍ර 04 ක් නිකුත් කර ඇති අතර ඉතිරි ආයතන සඳහා සිහි කැඳවීම් ද, පරීක්ෂණ ගාස්තු ගෙවන ලෙසද අඩුපාඩු සකස් කරන ලෙස දන්වා ඇති බව.	පරිසර බලපත්‍ර නිකුත් කර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3.5 මතභේදයට තුඩුදෙන ගණුදෙණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2010 වර්ෂයේ සූරියවැව සිඟිති උයන භූමියේ කඩ කාමර 04 ක් ඉදිකිරීමට යෝජනා කර ඒ වෙනුවෙන් පුවත්පත් දැන්වීමක් පලකර ටෙන්ඩර්කරුවන් ගෙවනු ලබන එක්වන් මුදල් පදනම් කරගෙන හා ඉතිරි මුදල සභා අරමුදලින් යෙදීමට සභා අනුමැතිය ඇතිව ආරම්භ කර තිබුණු මෙම ව්‍යාපෘතිය නිසි පරිදි පුවත්පත් දැන්වීම් පල නොකිරීම, නියමිත කාලය තුළ විධිමත්ව කඩ කාමර ඉදිකර ටෙන්ඩර්කරුවන් වෙත ලබාදීමට කටයුතු නොකිරීම මත ඉදිකර තිබූ කඩ කාමර 04 ක් වෙනුවෙන් සභාව විසින් හා ටෙන්ඩර්කරුවන්ගේ මුදලින් දරන ලද වියදම් එකතුව රු.මිලියන 2.22 ක් ද, අනාර්ථික ගණුදෙනුවක් බවට පත්වූ විධිමත්ව සකස් නොකරන ලද දැන්වීම් පලකිරීම් ගාස්තුව වූ රු.12,096 ක් ද, ගිවිසගත් කාලය තුළ කඩ කාමර ඉදිකර ටෙන්ඩර්කරුවන් වෙත ලබා නොදීම හේතුවෙන් හටගත් නඩු කටයුතු වෙනුවෙන් 2025 ජනවාරි 28 තෙක් ගෙවන ලද එකතුව රු.මිලියන 1.46 ක් වූ නඩු ගාස්තුද වසර 08 කට අධික කාලයක් කඩ කාමර 04 නිශ්කාර්යව තිබීමෙන් අහිමිව ඇති කඩ කුලී ආදයම්ද හේතුවෙන් සභාවට එකතුව රු.මිලියන 3.69 කට අධික පාඩුවක් වී තිබුණි.	විගණන නිරීක්ෂණය පිළිගන්නා බව.	විධිමත් පරීක්ෂණ පවත්වා සභාවට සිදුවූ පාඩු ආදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට සහ සභා දේපල නිශ්කාර්යව නොතබා ආදායම් උත්පාදනය කර ගැනීමට කටයුතු කළ යුතුය.

3.6 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභා බල ප්‍රදේශයේ පවතින සහ සභාව විසින් පරිහරණය කරනු ලබන ඉඩම් 168 ක සහ ගොඩනැගිලි 11 ක නීත්‍යානුකූල අයිතිය 2024 දෙසැම්බර් 31 වන විටත් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉඩම් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් සිටින බව.	සභාව සතු ඉඩම් 168 ක හා ගොඩනැගිලි 11 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය.
(ආ)	සභාව සතු ටිපර් රථ දෙකක මයිලෝ මීටරය පිළිවෙලින් 2021 අගෝස්තු 13 හා 2023 අගෝස්තු 10 යන දිනවල සිට අක්‍රියව පැවතියද ඒවා යලි සකස් කිරීම සඳහා 2025 ජනවාරි 28 දින වන විටත් කටයුතු කර නොතිබුණි. ඒ අනුව එම වාහනවල ඉන්ධන භාවිතය සම්බන්ධයෙන් නිසි ඇගයීමක් කළ නොහැකි තත්ත්වයකට පත්ව ඇති බව නිරීක්ෂණය විය.	අලුත්වැඩියාව සඳහා ගෙන්වා තිබූ උපකරණ මෙම රථවලට නොගැළපීම නිසා සැපයුම් විෂය වෙත එම මීටර් බෝර්ඩ් ප්‍රසම්පාදනය කර ඇණවුම් කිරීමට තොරතුරු සපයා ඇති බව.	වාහනවල මයිලෝ මීටර යථාතත්වයට පත්කර, ඉන්ධන භාවිතය පිළිබඳ අධීක්ෂණය කළ යුතුය.

3.7 කොන්ත්‍රාත් පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
හම්බන්තොට පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දිස්ත්‍රික් ඉංජිනේරු විසින් අංක HACLG/DEV/01/COH සහ 2024 මැයි 22 දිනැති ලිපිය මඟින් සියලුම පළාත් පාලන ආයතන වෙත 2024 වර්ෂයට අදාළව කොන්ක්‍රීට් කැටගල් මාර්ගයන්හි කොන්ක්‍රීට් හැඩයම් වැඩ (curb formwork) සඳහා යොදාගත හැකි විශේෂිත මිල රේටයක් (SSR) සකස් කර තිබුණද, 2024 වර්ෂයේදී සභාව විසින් ඉටුකර ගෙවීම් කර තිබූ කර්මාන්ත තුනකට අදාළව උක්ත වැඩ විෂය සඳහා දකුණු පළාත් ගොඩනැගිලි මිල ගණන්හි රු.1,850 ක (FW04) රේටය යොදාගෙන ගෙවීම් කිරීම නිසා රු.243,367 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.	විමසුමේ දක්වා ඇති මාර්ග සඳහා ගෙවීම් කිරීමේදී විශේෂ රේටය පිළිබඳ දැනුවත් වී නොතිබුණු බව සහ රඳවාගෙන ඇති සියයට 10 රැඳවුම් මුදල් ගෙවීමේදී වැඩිපුර ගෙවා ඇති මුදල අයකර ගන්නා බව.	නිවැරදි රේටයන් පදනම් කරගෙන කර්මාන්ත සඳහා ගෙවීම් කළ යුතුය.

3.8 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාවේ තනතුරු 9 කට අදාළ අතිරික්තතා 19 ක් විධිමත් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි.	පවත්නා රාජ්‍ය ප්‍රතිපත්තිමය තීරණ මත නව තනතුරු ඇති කිරීමට නොහැකි වී ඇති බව දැනුම් දී ඇති බව.	සභාවේ කාර්ය මණ්ඩල අවශ්‍යතා පිළිබඳව සමාලෝචනයක් සිදුකළ යුතුය.

(ආ)	අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ මු.රෙ. 113(6) (ආ) ඡේදයට අනුකූලව අත්තිකාරම් "බී" ගිණුම යටතේ ලබාදුන් ණය හෝ අත්තිකාරම් මුදල් වලින් පාඩු සිදුවීමක් රජය අපේක්ෂා නොකරන බැවින් එම ණය හෝ අත්තිකාරම් මුදල් ආපසු අයකර ගැනීමට සියලු ක්‍රියාමාර්ග ගතයුතු වුවත්, 2023 ජුනි 07 දින සිට වැඩ තහනම් කර තිබූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.250,418 ක ආපදා ණය සහ උත්සව අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	හිඟ මුදල කාලාත්‍රයාගෙන් අයකර ගැනීම සඳහා කලාප අධ්‍යාපන කාර්යාලයට ලිපි යොමුකර ඇති බව.	යොමුගත චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි ප්‍රකාරව හිඟ ණය ශේෂ කඩිනමින් අයකිරීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වරිපනම් හා බදු හා ආදායම් ආධාර විෂයයන් 02 හි අහිතකර විචලනය රු.මිලියන 14.26 ක් වූ අතර එහි විචලනය සියයට 10 ත් සියයට 23 ත් අතර විය.	ඇස්තමේන්තු කර තිබුණද විනෝද බදු ආදායම අඩුවීම සහ වැටුප් ප්‍රතිපූර්ණය නොවීමත් මන්ත්‍රී දීමනා ප්‍රතිපාදන නොලැබීමත් මෙම විචලනයට හේතුවූ බව.	විචලනයන් අවම කිරීමත්, සැලසුම්කරණය විධිමත් කර ගැනීමත්, ආදායම් රැස්කිරීම කාර්යක්ෂම කර ගැනීමත් සිදු කළ යුතුය.
(ආ)	ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව සහ ප්‍රාග්ධන වියදම් විෂයයන් දෙකෙහි අහිතකර විචලනය රු.මිලියන 10.52 ක් වූ අතර එහි වචලනය සියයට 28 ත් සියයට 31 ත් අතර විය.	සැලසුම්කළ ප්‍රාග්ධන වැඩසටහන් ප්‍රමාණයට වඩා වැඩිපුර ව්‍යාපෘති ගණනක් ක්‍රියාත්මක කිරීමට හැකිවූ බව සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ අලුත්වැඩියා වියදම් වැඩිපුර දැරීමට සිදුවූ බව.	විචලනයන් අවම කරගත යුතු අතර ඒ සඳහා සැලසුම්කරණය විධිමත් කළ යුතුය.

4.2 පාරිසරික ගැටලු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මදුනාගල ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ රැස්කරන දිරන කසළ විවෘත පරිසරයට මුදාහැරීම පමණක් සිදු කරන අතර, 2024 දෙසැම්බර් 31 දින වන විටත් කොම්පෝස්ට් අංගනයක් ඉදිකර, කොම්පෝස්ට් නිෂ්පාදනය කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.	2025 වර්ෂයේ දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ කොම්පෝස්ට් අංගනය සැකසීම සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇති බැවින් කොම්පෝස්ට් අංගනය සැකසීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව.	ඝණඅපද්‍රව්‍ය කළමනාකරණය විධිමත්ව කළ යුතුය.

(ආ)	2000 අංක 53 හා 1988 අංක 56 දරණ පනත් මඟින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පරිසර පනත යටතේ ප්‍රකාශිත 2264/18 හා 2022 ජනවාරි 27 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව සූරියවැව ප්‍රාදේශීය සභාවේ ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ ඇති මළ අපසන්දන පොදු පිරිපහදු පද්ධතිය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබාගත යුතු වුවද, එම බලපත්රය ලබා ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.	2025 අප්‍රේල් 17 මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් විසින් ක්ෂේත්‍ර පරීක්ෂණය සිදු කරනු ලැබූ අතර එම වාර්තාව ලැබුණු පසු බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරන බව.	පනතේ විධිවිධාන ප්‍රකාරව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතුය.

4.3 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 අංක 19 දරණ තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව ප්‍රාදේශීය සභාව විසින් ඉදිකරන ලද ගලි පිරිපහදු මධ්‍යස්ථානය, පුළුල්කර සකස් කිරීම සියයට 100 ක් ලෙස ප්‍රගතිය දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් මෙම ව්‍යාපෘතිය ඉටුකර නොතිබුණි.	ඉදිරියේදී ලැබෙන අරමුදල් නිශ්චිතව හඳුනාගෙන සැලසුම් සකස් කරන බව.	සැලසුම් කළ කාර්යයන් ක්‍රියාත්මක කර නිවැරදි ප්‍රගතිය දැක්විය යුතුය.